(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 367.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 ජූනි මස 05 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2581/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගම්මානවලට කවර කාල සීමාවක් තුළදී විදුලිය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී උතුරු පළාතේ එකී සියලු ගම්මානවලට විදුලිය ලබාදීමේ හැකියාවක් තිබුනේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3113/'12

2.

ගරු රවි කරුණානායක මහතා,— ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (2)

(අ) 2010 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දේශපාලනඥයින් සහ දේශපාලන සම්බන්ධකම් සහිත නිලධාරීන් විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් අතරින් 2010 වර්ෂයේ සිට හිමිකම් පවරාදෙන ලද, කල්බදු දෙන ලද සහ බලපත්‍ර හෝ "ස්වර්ණභූමි" ඔප්පු මත අන්සතු කරන ලද රජයේ ඉඩම්වල නම්, අක්කර ගණන සහ වටිනාකම එක් එක් ඉඩම අනුව කවරේද;

(ii) එකී ඉඩම් නිසි ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය නොකරමින් එසේ පවරාදීමට හෝ භාරදීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) යටතේ සඳහන්කර ඇති ප්‍රදේශයේ දශක ගණනාවක් පදිංචිව සිටි ජනතාවට සහ අනෙකුත් අයට එකී ආකාරයට ඉඩම් ලබාගැනීමේ අවස්ථා සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදී ග්‍රහණයේ පැවති ඉඩම් නිදහස් කරගන්නා මුවාවෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි වෙරළබඩ ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කර පවරාගන්නා බවට එල්ලවී ඇති චෝදනාවන්ට සත්‍ය කරුණු පදනම්වී තිබේද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3369/'12

3.

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයස අවුරුදු 2-5 අතර ළමයින් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමට රජය සැලසුම්කර තිබේද;

(ii) ඒ අනුව මේ වන විට නැවුම් කිරි වීදුරුවක් ලබාගැනීම සඳහා සුදුසුකම් ඇති ළමයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ වෙනුවෙන් 2013 අයවැයෙන් වෙන්කර තිබූ මුදල කොපමණද;

(iv) ඒ අනුව එක් ළමයෙකුට නැවුම් කිරි ලබාදීම සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වන විට ලියාපදිංචි කර ඇති පෙරපාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013 වර්ෂයේදී පෙරපාසල්වල අධ්‍යාපනය ලැබූ දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ශ්‍රී ලංකාවට අවශ්‍යව ඇති පෙරපාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3418/'13

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම හා පහළ මධ්‍යම පන්තියේ ජනතාවගෙන් බහුතරයක් ප්‍රවාහන කටයුතු සඳහා ත්‍රිරෝද රථ හා යතුරුපැදි භාවිතා කරන බවත්;

(ii) මෙම රථ හා බැඳුණු සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් බිහිවී ඇති බවත්;

(iii) ත්‍රිරෝද රථ, යතුරුපැදි සහ ඒවායේ අමතර කොටස්වල මිල අධිකවීම එම රැකියා අඩපණවීමට හේතුවිය හැකි බවත්;

(iv) ත්‍රිරෝද රථ හා යතුරුපැදි සඳහා දැනට අයකරනු ලබන අධික බදු ඒවායේ මිල ඉහළ යාමට හේතු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආනයනය කිරීමෙන් පසු 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව තුළදී අයකරනු ලබන බදු මුදල් හා වෙනත් අයකිරීම් ප්‍රමාණයන් ප්‍රතිශත වශයෙන්, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(ii) ත්‍රිරෝද රථ හා යතුරුපැදි සඳහා බදු සහන ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3711/'13

5\.
ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 මාර්තු මස වන විට සිටි මහජන බැංකුවේ සභාපතිවරයාගේ නම හා ලිපිනය කවරේද;

(ii) ඔහු එම තනතුරට අමතරව රජයේ වෙනත් කවර හෝ තනතුරක් දැරුවේද;

(iii) එසේ නම්, එම තනතුර කවරේද;

(iv) එම එක් එක් තනතුරු වෙනුවෙන් ලැබූ වැටුප් සහ අනෙකුත් සියලු දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඔහුගේ අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් කවරේද;

(vi) ඔහුට බැංකු ක්ෂේත්‍රය පිළිබඳව තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සහ පළපුරුද්ද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජනතාවගේ තැන්පතු විශාල වශයෙන් පවතින මහජන බැංකුවට පූර්ණ කාලීන සභාපතිවරයෙක් අවශ්‍ය බව පිළිගන්නේද;

(ii) එසේ නම්, විශාල කාර්යයන් ප්‍රමාණයක නිරතව සිටින පුද්ගලයෙක් එම තනතුර සඳහා පත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4288/'13

6\.
ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට මහජන බැංකුව දැඩි මූල්‍ය අර්බුදයකට ලක්වී ඇති බවත් එයට ප්‍රධානම හේතුව එම බැංකුව මගින් ව්‍යාපාරිකයින් 50 දෙනෙකුට ලබා දුන් කෝටි 4063 ක ණය මුදල ගෙවීම් පැහැර හැරීම බවත් 2012 කෝප් (COPE) වාර්තාව මගින් පෙන්වා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ණය මුදල් නොගෙවූ අයගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම එක් එක් තැනැත්තාට ලබා දී ඇති ණය මුදල සහ අය විය යුතු පොලිය කොපමණද;

(iii) ඉහත ණය මුදලට අමතරව මහජන බැංකුවෙන් රජය ලබා ගෙන ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ණය මුදල් ගෙවීම් පැහැර හැර ඇති නිසා මහජන බැංකුව මූල්‍ය අර්බුදයකට මුහුණ දී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මෙම ණය ආපසු අය කර ගැනීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4307/'13

7.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තාවී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, වාර්ෂික පදනමින් කොපමණද;

(ii) 2011 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු රෝගය හේතුවෙන් සිදුවූ බවට වාර්තාවී ඇති මරණ සංඛ්‍යාව, වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2009 ජනවාරි මස සිට මේ දක්වා,

(i) හඳුනාගත් ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන ලෙස හඳුනාගත් පාසල්, විශ්වවිද්‍යාල හා රාජ්‍ය ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2010 ජනවාරි මස සිට මේ දක්වා,

(i) ශ්‍රී ලංකාවේ ඉහළම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූ දිස්ත්‍රික්ක තුන කවරේද;

(ii) එම එක් එක් දිස්ත්‍රික්කය තුළ හඳුනාගත් මදුරුවන් බෝවන ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු වසංගතයට පිළියම් යෙදීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටු කවරේද;

(ii) එම එක් එක් කමිටුව පත් කළ දිනය කවරේද;

(iii) එම එක් එක් කමිටුවේ බලපැවරුම කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4326/'13

8.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හොරණ, ශ්‍රී මේධංකර මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාට එරෙහිව 2013 ඔක්තෝබර් මාසය වන විට පැවති විනය පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම විනය පරීක්ෂණවලට අදාළ කරුණු කවරේද;

(iii) එම විදුහල්පතිවරයාට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීමට සහ ඒ පිළිබඳ පියවර ගැනීමට ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4338/'13

9\.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ණයකර (බැඳුම්කර) නිකුත් කිරීම මගින් 2013 සැප්තැම්බර් හෝ ඔක්තෝබර් මාසයේදී හෝ ඊට ආසන්න කාලයේදී ජාත්‍යන්තර වානිජ වෙළෙඳපළ වෙතින් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 750ක් පමණ ණයට ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බැඳුම්කරයේ ස්වභාවය සහ වාර්ෂික පොලී අනුපාතිකයද සමගින් එහි නියමයන් හා කොන්දේසි කවරේද;

(ii) එකී නියමයන් හා කොන්දේසිවල විකල්ප වරණයන් හෝ ව්‍යතිරේඛ තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එම බැඳුම්කරය හරහා එකී අරමුදල් සපයා ගැනීමෙහි පරමාර්ථය කවරේද;

(ii) එකී බැඳුම්කරයෙහි විදේශ විනිමය අවදානම සම්බන්ධයෙන් වගකීම දරන තැනැත්තා කවුරුන්ද;

(iii) ඉහත කී ක්‍රියාමාර්ග ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා තවත් යම් පාර්ශ්වයක් අතර ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් නම්, එම සබඳතාවෙහි ස්වභාවය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එමෙන්ම, අදාළ බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් වූ කළමනාකරුවන් (අවසන් ආයෝජකයින් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව අතරේ අතරමැදිකරුවන්) කවුරුන්ද යන්න සහ ඔවුන්ට ගෙවන ලද ගාස්තු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4428/'13

10\.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009.09.24 දිනැති අංක 1620/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය පරිදි රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ, අන්තර්කාලීන විධිවිධාන යටතේ සේවයේ නියුතු පුස්තකාලයාධිපතිවරුන් හට පෙරදාතම් කර අදාළ පන්ති සඳහා ලබා දිය යුතු උසස්වීම් මෙතෙක් නිසියාකාරව ලබා දී නොමැති බවත්;

(ii) දැනට රජයේ පුස්තකාලයාධිපති සේවයේ බඳවා ගැනීම් පන්තිය වන III පන්තියේ පුරප්පාඩු රාශියක් පවත්නා බවත්;

(iii) පෙර කී සේවා ව්‍යවස්ථාව තුළ හඳුනාගෙන ඇති සේවක සංඛ්‍යාවෙන් 70%කට වැඩි ප්‍රමාණයක් මේ දක්වා ද පුරප්පාඩුව පවත්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1981 වර්ෂයේ සිට පෙර කී පුස්තකාලයාධිපති සේවයේ අධි / විශේෂ පන්තියේ වැටුප් පරිමාණය දීප ව්‍යාප්ත සේවාවල II / II පන්තියේ වැටුප් පරිමාණයට ඉහළින් පැවති බවත්;

(ii) අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් පුස්තකාලයාධිපති සේවයේ විශේෂ පන්තිය පෙර කී දීප ව්‍යාප්ත සේවා පිහිටුවන ලද වැටුප් පරිමාණයට බොහෝ පහළින් වූ MN - 07 වැටුප් පරිමාණය මත පිහිටුවා ඇති බවත්;

(iii) එමගින් පුස්තකාලයාධිපති විශේෂ පන්තියට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එම පියවර ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙදිනක සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4442/'13

11.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැයට කිරුළ 2014 සංවර්ධන වැඩසටහන යටතේ කුලියාපිටිය කාර්මික විද්‍යාලයට ලබා දුන් පහසුකම් කවරේද;

(ii) එකී පහසුකම් ලබාදීම වෙනුවෙන් වැය කරන ලද ප්‍රතිපාදනවල වටිනාකම කොපමණද;

(iii) එම ප්‍රතිපාදන යටතේ සිදු කළ නවීකරණ කටයුතු සහ පහසුකම් ලබාදීමේ කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර අවසන් කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4561/'13

12.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්නයක් ලෙස 2013.07.26 දින පාර්ලිමේන්තුවේදී අසන ලද අංක 3194/12 දරන ප්‍රශ්නයේ (අ) කොටසට අදාළව ලබා දුන් පිළිතුර පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) එම පිළිතුරට අනුව, කොළඹ මහ නගර සභාවට අයත් නිල නිවාසයක සිටින අනවසර පදිංචිකරු ඉවත් කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4567/'13

13.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් කර ඇති ආකාරයට වයස අවුරුදු 18 සිට 22 දක්වා සෑම අයෙකුටම තම අභිමතාර්ථය අනුව අවශ්‍ය තෘතීයික අධ්‍යාපනයක් හෝ පුහුණුවක් ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ දෙකක් දක්වා මුදලක් වෙන්කර දීම සඳහා රජය කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, මේ වන විට එම පහසුකම ලබා ගෙන ඇති තරුණ තරුණියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම මූල්‍ය පහසුකම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iv) ලබා දෙන එම මුදල නැවත අය කර ගනු ලබන්නේද;

(v) එම මුදල නැවත අය කර ගනු ලබන්නේ නම්, එකී මුදල භාවිතා කරනු ලැබූ අධ්‍යාපනය හෝ පුහුණුව අවසන් කිරීමෙන් කොපමණ කාල සීමාවකට පසුව එය අය කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා එම පහසුකම ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කර නොමැති නම්, මහින්ද චින්තන ඉදිරි දැක්ම මගින් එම තරුණ තරුණියන්ට ලබා දී ඇති එම පොරොන්දුව යථාර්ථයක් බවට පත් කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4666/'13

14\. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ඖෂධ ගෙන්වීමේදී ඖෂධ තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටියක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) ඖෂධ ගෙන්වීම සඳහා මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති සමාගම් කවරේද;

(iv) එම සමාගම් හරහා ගෙන්වන ඖෂධ ශ්‍රී ලංකාව තුළ දී තත්ත්ව පරීක්ෂාවකට ලක් කරන්නේද;

(v) එසේ නම්, එය සිදු කරනු ලබන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට ගෙන්වනු ලබන ඖෂධ වර්ගවල කල් ඉකුත්වීමේ දිනය නිර්ණය කිරීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත කවරේද;

(ii) ඖෂධ වර්ග ආනයනය කිරීම ඒවායේ නිෂ්පාදිත දින සිට කවර කාල සීමාවක් තුළ සිදු කළ යුතු වන්නේද;

(iii) පසුගිය කාලය පුරාම රජයේ රෝහල්වලින් කල් ඉකුත් වූ ඖෂධ හමුවීම් වාර්තා වීමට හේතු කවරේද;

(iv) පසුගිය වර්ෂය තුළ කල් ඉකුත්වීම නිසා රජයේ රෝහල්වලින් ඉවත් කරන ලද ඖෂධ ප්‍රමාණය සහ එහි වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4746/'14

15\. ගරු අශෝක් අබේසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අඛණ්ඩව පාඩු ලැබීමට හේතු වී ඇති කරුණු කවරේද;

(ii) සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම තෙල් පිරිපහදුවේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iv) වර්ෂ 2011 සිට 2013 දක්වා කාල සීමාවේ දී වාර්ෂිකව මෙරටට ගෙන්වන ලද බොර තෙල් ප්‍රමාණය කොපමණද;

(v) බොරතෙල් ආනයනය අඩු වීම නිසා පිරිපහදු කළ තෙල් ගෙන්වීම හේතුවෙන් රජයට අලාභයක් සිදු වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

2.

මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

3.

වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

4.

ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

5.

පණ්ඩු බණ්ඩාරනායක හෙල ජන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

6.

දක්ෂිණ ලංකා තෘතීයික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

7.

හිස්බුල්ලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

8.

බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

9.

මිස්ටිකල් රෝස් ජාත්‍යන්තර ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

10.

හිරා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

11.

ශ්‍රී ලංකාවේ ලේඛකයෝ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

12.

දාම්පේ, මීගොඩ බෝධිවර්ධනාරාම ශ්‍රී මධුරසාම පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

13.

ශ්‍රී ලංකා ප්‍රභා ලේඛක සමිති සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*19.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ධසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ධසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

22.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

23.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

24.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

25.

අල් ජමියාතුල් ෆ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**